# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,537 - 2008 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2008.02.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 152 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 155 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට් නිවේදන* බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තතමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

- i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
- ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
- iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
- vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දූරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දූරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දූරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන් හි ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී :

(අ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව;
(ආ) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව;
(ඇ) පාලන පශු වෛද්‍ය ශාඛාව.

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) *විද්‍යුත් ඉංජිනේරු ශාඛාව :*
විදුයුත් හා විදුලි සංඥා ඉංජිනේරු නිලධාරි (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්).

විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී උපාධියක් හෝ විද්‍යුත් හා විදුලි සංනිවේදන පිළිබඳව ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

(ආ) *ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව :*
සිවිල් ඉංජිනේරු නිලධාරි (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්).

සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය/ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී.) /එච්එන්ඩීර්/එන්ඩීර්එස් හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව ඒ හා සමාන සුදුසුකම් තිබීම.

(ඇ) *පාලන පශු වෛද්‍ය ශාඛාව :*
පශු වෛද්‍ය නිලධාරි (ප්ලයිට් ලෙප්ටිනන්ට්/ප්ලයින් ඔෆිසර්/පයිලට් ඔෆිසර්).

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ පශු වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම.

3. අනෙකුත් සුදුසුකම් :
(අ) පුරවැසි භාවය ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) *උස* : පිරිමි අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතුය.
(ඇ) පපුව අඟල් 32ට නොඅඩු විය යුතුයි.
(ඈ) *වර්ණ දෘෂ්ටිය* : සීපී 2
(ඉ) *දෘෂ්ටි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).
(ඊ) *වයස* :
1. *විද්‍යුත් ඉංජිනේරු ශාඛාව* - 2008 අප්‍රේල් මස 15 වන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
2. *ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව* - 2008 අප්‍රේල් මස 15 වන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.
3. *පාලන පශු වෛද්‍ය ශාඛාව* - 2008 අප්‍රේල් මස 15 වන දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

4. යම් අයදුම්කරුවෙකුට වයස හෝ උස නියමිත සුදුසුකම් නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සළකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැළකිල්ලක් දක්වනු ලැබේ.

7. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ප්ලයින් ඔෆිසර්/ ප්ලයිට් ලෙප්ටිනන්ට් යන නිලයන් හි නිත්‍ය අධිකාරියට පත්කරනු ලැබේ.

8. *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*— තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා,පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිවයුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක." කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳි ඇත්නම්, පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකිවේ.

11. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

12. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

13. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ආ) (15) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ.

14. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

15. (අ)ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි ලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

පයිලට් ඔෆිසර් - රු. 2,11,800 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 2,75,220 - 34 x 7,740 - රු. 5,38,380 වසරකට

ෆ්ලයිට් ලෙප්ටිනන් - රු. 3,21,660 - 28 x 7,740 - රු. 5,38,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 - 24 x 7,740- රු. 5,38,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 - 20 x 9,480- රු. 5,51,700 වසරකට
ග්‍රෑප් කැප්ටන් - රු. 4,41,060 -18 x 12,600 - රු. 6,67,860 වසරකට

(ආ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 2,125 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 2,400ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.)
(6) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(7) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)
(8) ආහාර දීමනාව මසකට රු. 7,233.23ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)
(9) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(10) නොමිලේ ගමන් කළහැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(11) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(12) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(13) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).
(14) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(15) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෑප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන්වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියළුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2008 පෙබරවාරි මස 26 වන දින මධ්‍යාහ්න 1200 ට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරී, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "..................................ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත්" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම්දිය යුතුය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතුය :
(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය හට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

* *සැළකිය යුතුයි.*-මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත්වේ.

19. *තෝරාගැනීම සම්මුඛ පරීක්‍ෂණ ආදිය* :

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්‍ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ........... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :—————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ස්ථිර ලිපිනය :—————.

5. තැපැල් ලිපිනය :—————.

6. උපන් දිනය :—————.

2008 අප්‍රේල් මස 15 වන දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.

7. උස : අඩි :—————. අඟල් :—————.

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

9. දිස්ත්‍රික්කය :—————.

10. ඡන්ද කොට්ඨාසය :—————.

11. ග්‍රාම සේවක කොට්ඨාසය :—————.

12. දුරකථන අංකය :—————.

13. විවාහක හෝ අවිවාහක බව :—————.

14. පාසැල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසැලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br>අ. පො. ස. (උ. පෙළ)<br>වෘත්තීය සුදුසුකම්<br>වෙනත් | | |

15. පාසැලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| සේවායෝජකයාගේ නම සහ ලිපිනය | රකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

16. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා :- | | | |
| මව :- | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :—————.

18. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :—————.

19. පාසැලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :—————.

20. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

21. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :—————.

22. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.

23. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :—————.

24. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

25. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථාව ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

02-404

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉස්ලාමීය ධර්ම ආචාර්යවරුන් සඳහා ෂරීආ සහතික පත්‍ර විභාගය - 2008**

රෙගුලාසි හා උපදෙස් :

1. උක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂිකව දීප ව්‍යාප්තව පවත්වනු ලැබේ. 2008 වර්ෂයේ විභාගය ජූලි මස පැවැත්වේ. අනතුරුව විභාග කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂිකව විභාගය පවත්වන කාලය ගැසට් නිවේදන මගින් දැනුම් දෙනු ලැබේ.

2. මෙම දැන්වීමේ ඇමුණුම -1 හි දක්වා ඇති නගරවල, ඒ ඒ දිස්ත්‍රික්කයේ සිටින විභාග අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටවනු ලැබේ. යම් මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් සංඛ්‍යාවක් අයදුම්කරුවන් නොමැති අවස්ථාවල එම විභාග මධ්‍යස්ථාන අවලංගු කර අදාළ අයදුම්කරුවන් ආසන්නම විභාග මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලැබේ.

3. *භාෂා මාධ්‍යය.*—මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. එහෙත් යම් අයදුම්කරුවෙකුට තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

4. *සුදුසුකම්.*—මෙම විභාගය සඳහා අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතුය :

4.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ඉස්ලාමීය දහම් පාසල් (අහදියා - අල්කුර්ආන්) අවසාන විභාගයෙන් සමත් වී තිබීම;

4.2 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ආරාබි විද්‍යාලවලින් නිකුත් කරනු ලබන මවුලවි සහතිකයක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන අල් ආලිම් - ප්‍රාරම්භ විභාගයෙන් සමත් වී තිබීම;

4.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ඉස්ලාම් හෝ ඉස්ලාමීය ශිෂ්ඨාචාරය විෂයය ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම;

4.4 ඉස්ලාම් විෂයයේ සම්මාන සාමාර්ථයක් සහිතව අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්, අහදියා පාසලක හෝ ආරාබි විද්‍යාලක හෝ අවුරුදු දෙකකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්ය භවතෙකු වීම.

*සටහන 1* - විභාගයට පෙනී සිටින විභාග අයදුම්කරුවන් ඉහත 4 වන කොටසෙහි සඳහන් සුදුසුකම් ලබා ඇති බව අහදියා පාසලේ විදුහල්පති විසින් හෝ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව අනුමත කර ඇති අරාබි විදුහලේ විදුහල්පති විසින් හෝ සහතික කළ යුතුය.

*සටහන 2* - මෙම විභාගයට ලියාපදිංචි කර ඇති අහදියා පාසලේ විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හෝ මගින් පමණක් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස මෙම විභාගයට අයදුම් කළ නොහැකිය.

5. ලියාපදිංචි වී ඇති සියළු අහදියා පාසල්වලට හා අරාබි විදුහල්වලට අයදුම්පත්‍ර හා අදාළ විස්තර තැපෑලෙන් එවනු ලැබේ. එසේ අයදුම්පත්‍ර නොලද අවස්ථාවල, අදාළ ආයතන ප්‍රධානීන්ට, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් විමසීම් කළ හැකිය.

5.1 අයදුම්පත්‍ර පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත විභාග දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර අනෙක් පිටපත තම ආයතනයේ ගොනු කර තබා ගත යුතුය.

5.2 අයදුම්පත්‍ර පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කළ යුතුය. එසේ නොමැති අයදුම්පත්‍ර හා අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනයට පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

5.3 අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය 2008 මාර්තු 31 වේ.

5.4 නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍ර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය :

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවය,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

6. පළමුවර අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. සෙසු අයදුම්කරුවන් විභාග ගාස්තු ලෙස රු. 140 (එකසිය හතළිහක්) ගෙවිය යුතුය. ඌන සමත් ලැබූ එක් විෂයයකට පමණක් පෙනී සිටින අයදුම්කරුවන් එම විෂය වෙනුවෙන් රු. 35 (තිස් පහක්) ගෙවිය යුතුය.

6.1 *විභාග ගාස්තුව ගෙවිය යුතු ආකාරය* - අදාළ මුදල් ප්‍රමාණය තැපැල් කාර්යාලයකට ගෙවා ලැබෙන රිසිට් පත අයදුම්පත සමග යාකර එවිය යුතුය. (රිසිට් පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම නිර්දේශ කෙරේ)

6.2 විභාග ගාස්තු අවශ්‍යතාව අනුව, කලින් කලට වෙනස් කරනු ලැබේ.

7. විභාග ප්‍රවේශ පත්‍ර අදාළ, අහදියා පාසලේ විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති හරහා හෝ නිකුත් කරනු ලැබේ.

7.1 විභාග අයදුම්කරුවන් විභාගයට පෙනී සිටින මුල් අවස්ථාවේදීම තමාගේ විභාග ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. එසේ නොමැති විට විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට සිදුවේ.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන අහදියා පාසලේ විදුහල්පති හෝ අරාබි විදුහලේ විදුහල්පති විසින් සහතික කර තිබිය යුතුය.

8. *පුද්ගලික අනන්‍යතාවය සහතික කිරීම.*—අයදුම්කරුවන් තම අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් ඒවායින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදෙස් ගමන් බලපත්‍රය.

9. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම හා සාමාර්ථය තීරණය කිරීම.*—මෙම විභාගයට අදාළ විෂයයන් පහෙන්ම සමත් වන්නන් විභාගය සමත් වන්නන් ලෙස සැලකේ. ඔවුන්ට ඉස්ලාමීය ධර්ම ආචාර්යවරුන් සඳහා වන ෂරීආ සහතිකය පිරිනැමේ.

එක් විෂයයකට පමණක් 25ට නොඅඩු ලකුණු ලබා අනෙක් විෂයයන් හතරෙන් සමත් අය ඌන සාමාර්ථය (Referred) ලබා ඇති අය ලෙස සැලකේ. එසේ ඌන සාමාර්ථය ලබන අයදුම්කරුවන් ඊළඟ විභාගයේ දී අදාළ විෂයයට පෙනී සිට සමත් වීමෙන් උක්ත සහතිකයට හිමිකම ලබයි. මෙම ඌන සාමාර්ථය ලැබූ විෂයයට නැවත පෙනී සිටීමට අයදුම් කිරීමේ දී අනෙකුත් විෂයයන්ට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය ද පෙනී සිටි විෂයයන්හට ලබා ගත් ප්‍රතිඵල ද සඳහන් කළ යුතුය.

10. *විභාග පිළිබඳ විස්තර.*—මෙම විභාගය ප්‍රශ්න පහකින් (05) යුක්තය. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය පැය තුනක් (03) වේ. මෙ ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ.

1. අකීදා හා මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර);
2. අල් ෆික්හුල් ඉස්ලාමි (ඉස්ලාමීය නීති පද්ධතිය);
3. අස්සීරා වත්තාරිකුල් ඉස්ලාමි (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය);
4. සමාජ ජීවිතය හා ආචාරධර්ම (අල් අඛ්ලාක් වස්සුලූක්);
5. ඉස්ලාමීය සාහිත්‍ය සහ අරාබි බස (අල්ලුකකතුල් අරබියියා වල් අදබුල් ඉස්ලාමි).

එක් එක් විෂයයට අදාළ විෂයය අන්තර්ගතය මෙම දැන්වීමේ ඇමුණුම - 2 හි දක්වා ඇත.

11. ප්‍රශ්න පත්‍රයෙහි ව්‍යුහය.—එක් එක් ප්‍රශ්න පත්‍රය I කොටස, II කොටස, III කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

* කොටස I හි අඩංගු ප්‍රශ්නය අනිවාර්ය වේ. කෙටියෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10ක් මෙහි අඩංගු වේ. එක් එක් ප්‍රශ්නයට ලකුණු හතරක් (04) බැගින් ලැබේ.

  *නිදසුන.*—එදිනෙදා කටයුත්තක් ඔබ ඉබාදතයක් කර ගන්නේ කෙසේද ? (ලකුණු 04).

  (ලකුණු 4x10 = 40)

* කොටස II හි ව්‍යුහගත ප්‍රශ්න පහක් ඉදිරිපත් කෙරේ. ඉන් කැමති ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය. එක් එක් ප්‍රශ්නයට ලකුණු 12ක් බැගින් හිමි වේ.

  (ලකුණු 12 x 4=48)

* කොටස III හි රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (02) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය. මෙම කොටස සඳහා ලකුණු 12ක් හිමි වේ.

  (ලකුණු 12 x 1=12)

***සාමාර්ථය තීරණය කිරීමේ නිර්ණායක***

* එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයක් (100)ක් බැගින් හිමි වේ.
* සාමාර්ථය ලැබීමට අවම වශයෙන් ලකුණු හතළිහක් (40) ලබා ගත යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | ලකුණු | 00 | - | 24 | තෙක් F |
| (ආ) | ලකුණු | 25 | - | 39 | තෙක් W |
| (ඇ) | ලකුණු | 40 | - | 54 | තෙක් S |
| (ඈ) | ලකුණු | 55 | - | 64 | තෙක් C |
| (ඉ) | ලකුණු | 65 | - | 74 | තෙක් B |
| (ඊ) | ලකුණු | 75 | - | 100 | තෙක් A |

***පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය***

ප්‍රතිඵල නිකුත් වී දින තිහක් (30) ඇතුළත්, මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කෙරෙන ආකෘති පත්‍ර යොදා ගනිමින් අදාළ ආයතනයේ විදුහල්පති හරහා ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කරවා ගත හැකිය. නැවත සමීක්ෂණය සඳහා ගාස්තුවක් අය කෙරේ. විභාග ප්‍රතිඵලවල වෙනස්වීමක් වුවහොත් පමණක් එම ගාස්තුව ආපසු ගෙවනු ලැබේ.

මෙහි සඳහන් රෙගුලාසි හා උපදෙස් පිළිපැදීමට සියළු විභාග අයදුම්කරුවන් බැඳී සිටී. මෙහි සඳහන් වී නැති යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2008 ජනවාරි මස 15 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඇමුණුම - 1

**විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර**

| *දිස්ත්‍රික්ක අංකය* | *නගර අංකය* |
|---|---|
| 1. කොළඹ දිස්ත්‍රික්කය : | |
| මධ්‍යම කොළඹ | 01 |
| බම්බලපිටිය | 02 |
| 2. ගම්පහ දිස්ත්‍රික්කය : | |
| තිහාරිය | 03 |
| මාබෝල | 04 |
| මීගමුව | 05 |
| 3. කළුතර දිස්ත්‍රික්කය : | |
| කළුතර | 06 |
| අලුත්ගම | 07 |
| 4. ගාල්ල දිස්ත්‍රික්කය : | |
| ගාල්ල | 08 |
| 5. මාතර දිස්ත්‍රික්කය : | |
| මාතර | 09 |
| 6. හම්බන්තොට දිස්ත්‍රික්කය : | |
| හම්බන්තොට | 10 |
| 7. කෑගල්ල දිස්ත්‍රික්කය : | |
| වරකාපොල | 11 |
| මාවනැල්ල | 12 |
| 8. කුරුණෑගල දිස්ත්‍රික්කය : | |
| කුලියාපිටිය | 13 |
| කුරුණෑගල | 14 |
| ගල්ගමුව | 15 |
| 9. පුත්තලම දිස්ත්‍රික්කය : | |
| හලාවත | 16 |
| පුත්තලම | 17 |
| කල්පිටිය | 18 |
| 10. අනුරාධපුර දිස්ත්‍රික්කය : | |
| අනුරාධපුරය | 19 |

| *දිස්ත්‍රික්ක අංකය* | *නගර අංකය* |
|---|---|
| කැකිරාව | 20 |
| ගලෙන්බිඳුනු වැව | 21 |
| 11. පොළොන්නරුව දිස්ත්‍රික්කය : | |
| කඳුරුවෙල | 22 |
| 12. මාතලේ දිස්ත්‍රික්කය : | |
| මාතලේ | 23 |
| 13. මහනුවර දිස්ත්‍රික්කය : | |
| මහනුවර | 24 |
| නාවලපිටිය | 25 |
| අකුරණ | 26 |
| 14. නුවරඑළිය දිස්ත්‍රික්කය : | |
| නුවරඑළිය | 27 |
| 15. රත්නපුර දිස්ත්‍රික්කය : | |
| බලන්ගොඩ | 28 |
| 16. බදුල්ල දිස්ත්‍රික්කය : | |
| බදුල්ල | 29 |
| වැලිමඩ | 30 |
| 17. මොණරාගල දිස්ත්‍රික්කය : | |
| බිබිල | 31 |
| 18. අම්පාර දිස්ත්‍රික්කය : | |
| සම්මන්තුරේ | 32 |
| කල්මුණේ | 33 |
| අක්කරෛපත්තු | 34 |
| 19. මඩකලපුව දිස්ත්‍රික්කය : | |
| කාත්තන්කුඩි | 35 |
| එරාවූර් | 36 |
| වාලෛච්චේනෛ | 37 |
| 20. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය : | |
| ත්‍රිකුණාමලය | 38 |
| මුතූර් | 39 |
| කින්නියා | 40 |
| 21. වවුනියා දිස්ත්‍රික්කය : | |
| වවුනියා | 41 |
| 22. මන්නාරම දිස්ත්‍රික්කය : | |
| මන්නාරම | 42 |
| 23. මුලතිව් දිස්ත්‍රික්කය : | |
| මුලතිව් | 43 |
| 24. කිලිනොච්චි දිස්ත්‍රික්කය : | |
| කිලිනොච්චි | 44 |
| 25. යාපනය දිස්ත්‍රික්කය : | |
| යාපනය | 45 |

## ඇමුණුම - 2

01. අකීදා හා මසාදිරුෂ් ෂරීආ
   1.1 ඉස්ලාමීය අකීදා
      1.1.1 ඉස්ලාමීය අකීදා - හැඳින්වීම හා සාමාන්‍ය අවබෝධය
      1.1.2 ඉස්ලාමීය අකීදා හි අන්තර්ගතය
         1.1.2.1 තව්හීද්
            - අල් උලුහියියා
            - අල් රුබූබියියා
            - අස්මාඋල් හුස්නා තුළින් අල්ලාහ්ගේ ස්වභාව අවබෝධ කර ගැනීම
         1.1.2.2 රූහානියියාත්
         1.1.2.3 නුබුව්වත්
         1.1.2.4 සම්ඉයියාත්
         1.1.2.5 කලා කද්ර්

      1.1.3 අකීදා ආශ්‍රිත කොටස්

   1.2 මසාදිරුෂ් ෂරීආ
      1.2.1 මසාදිරුන් නක්ලියියා - හැඳින්වීම
      1.1.2 වහී
         - වහී හි අවශ්‍යතාව
         - වහී වර්ග
      1.2.3 අල් කුර්ආන්
         1.2.3.1 - පහළවීම හා ගොනු කරනු ලැබීම
            - තර්තීබ් නුසුල් - තර්තීබ් තිලාවත්
         1.2.3.2 - ව්‍යුහය
            - මක්කි, මදනි
            - නාසික් මන්සුක්
            - මුහ්කම් - මුතෂාබිහ්
            - අස්බාබුන් නුසුල්
         1.2.3.3 - ඉඃජාසුල් කුර්ආන්
            - භාෂාව පදනම් කරගත් මූලික
            - නීති මූලික
            - විද්‍යා මූලික
         1.2.3.4 - තෆ්සීර් විද්‍යාව
            - ආරම්භය හා වර්ධනය
            - තෆ්සීර් වර්ග (මන්කුල්, මඃකුල්, නූතන තෆ්සීර් වර්ග)
         1.2.3.5 - අල්කුර්ආන් හා සම්බන්ධතාව
            - අල්කුර්ආනයට ළඟාවන ආකාරය
            - අල්කුර්ආනයේ පරමාර්ථ
            - අල්කුර්ආනය හදාරන ආකාරය
      1.2.4 අස්සුන්නා
         1.2.4.1 පදාර්ථය හා ව්‍යවහාරික විස්තර
         1.2.4.2 නීති මූලාශ්‍රයක් වශයෙන් සුන්නාව
         1.2.4.3 හදීස් සංරක්ෂණය
            - නබි (සල්) තුමාගේ කාලය
            - සහාබාවරුන්ගේ අවධිය
            - තාබිඊන්වරුන්ගේ අවධිය
            - තාබිඋත්තාබිඊන්වරුන්ගේ අවධිය
            - නූතන අවධිය
         1.2.4.4 හදීස් ආශ්‍රිතව බිහිවූ විද්‍යාවන් හා ඒවායේ ප්‍රතිඵල
            - අස්මාඋර් රිජාල්
            - ඉල්මුල් ජරාහ් වත්තඃතීල්
            - උසූලුල් හදීස්
         1.2.4.5 - හදීස් අවබෝධ කර ගැනීම
            - හදීස් සමස්ත ජීවිතයටම මග පෙන්වීමක්
            - හදීස් ග්‍රන්ථ

1.2.4.6 - හදීස් වෙත ළඟාවීම
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ හදීස් අවබෝධ කර ගැනීම (පරිසරය සංරක්ෂණය, සෞඛ්‍ය ආරක්ෂාව, ආර්ථිකය, විද්‍යාව)

1.2.5 සහායක මූලාශ්‍ර
1.2.5.1 ඉජ්තිහාද්
- පදාර්ථය හා ව්‍යවහාර විස්තරය
- ඉජ්තිහාදයේ අවශ්‍යතාව
- නීති ගුරුකුලයන් (- (මද්රසතුල් අසර් මද්රසතුර් රඋයු)

1.2.5.2 මුජ්තහිද්වරුන්
- සුදුසුකම් හා වර්ග
- ඔවුන්ගේ දායකත්වය
- මද්හබ් බිහිවීම හා වර්ධනය

1.2.5.3 සහායක මූලාශ්‍ර
- යාන්ත්‍රණ හා යෙදවුම්
- ඉජ්මා, කියාස්, මස්ලහා මූර්සලා, උර්ෆ්, ෂරඋ, සාබිකා, ඉස්තිහ්සාන්, ඉස්තිස්හාබ්, කව්ලුල් සහාබා, සද්දුස් සරාඉ

2. අල් - ෆික්හුල් ඉස්ලාම්
2.1 ඉබාදත්
2.1.1 තහාරත් - නජිස් පිළිබඳ විස්තරය
2.1.2 ඉබාදත්
- පදාර්ථය හා ව්‍යවහාරය
- ඉබාදත් වර්ග හා එහි මූලධර්ම
- ඊමාන් හා ඉබාදතය අතර සබඳතාව

2.2 මූලික ඉබාදතයන්
2.2.1 සලාතය
- වැදගත්කම
- වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.2 සකාත්
- වැදගත්කම පිළිවෙත්
- ප්‍රයෝජන
- සකාතය ආයතනගත කිරීමේ අවශ්‍යතාව
- සකාතුල් ෆිත්ර්

2.2.3 සව්මය
- වැදගත්කම වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.4 අල්හජ්
- වැදගත්කම
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.5 සෙසු ඉබාදතයන්
- සදකා, උම්රා
- තිලාවතුල් කුර්ආන්, තව්බා ඉස්තිඃපාර්
- දික්ර් අව්රාද්, දුආ
- කව්ෆ්, රජා, රිලා, තවක්කුල්, වරඋ, සුහ්ද්
- සියාරතුල් කුබුර්, කුර්බානීන්

2.3 මුආමලාත්
2.3.1 ඉස්ලාමීය ආර්ථිකය
- හැඳින්වීම
- සුවිශේෂ ලක්‍ෂණ

2.3.2 ඉපැයීම් හා වියදම් කිරීම
- ඉපැයීමේ වැදගත්කම
- කෘෂිකර්මය (මුසාරආ - ඉහ්යාඋල් මමාත්)
- කර්මාන්ත

2.3.3 වෙළෙඳාම
- වැදගත්කම
- ඉස්ලාම් අනුමත කර ඇති වෙළඳාම් ක්‍රම (සම්සරා බෛඋත් තක්සීද්, මුලාරබා, මුෂාරකා, මුරාබහා, ඉජාරා, රහ්න්)
- නූතන වෙළඳාම් ක්‍රම (අනෙකුත් වෙළඳාම් ක්‍රම හා සැසඳීම) නිදසුන්, බැංකු රක්ෂණය

2.3.4 ඉස්ලාම්හි තහනම් (හරාම්) කර ඇති ව්‍යාපාර කටයුතු
- බාල කිරීම්, සඟවා තැබීම්, රැවැට්ටීම
- අල්ලස, සූදුව, පොළිය
- හරාම් වූ ද්‍රව්‍ය විකිණීම

2.4 මුනාකහාත්
2.4.1 නිකාහ් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- නිකාහ් - නීති රීති
- බහු භාර්යා විවාහය

2.4.2 පවුල
- පවුල් ජීවිතයේ වැදගත්කම
- අඹු සැමි සබඳතා
- වගකීම් හා අයිතිවාසිකම්
- දරුවන් හදාවඩා ගැනීම පිළිබඳ උපදෙස් හා මඟපෙන්වීම
- පශ්චාත් හිමිකම/දෙමාපියන් හා දූ දරුවන්ගේ වගකීම් හා අයිතිවාසිකම්

2.4.3 දික්කසාදය
- දික්කසාදය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- වර්ග හා පිළිවෙත්
- ඉද්දා විස්තරය, නීති රීති, නඩත්තුව

2.5 ජිනායාත්
2.5.1 ජිනායාත් - හැඳින්වීම
2.5.2 අපරාධ
- වර්ග
- වැරදිවලට පිළියම්

2.5.3 දඬුවම්
- දඬුවම් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- හුදූද්, කිසාස්, තඃසීර්
- කෆ්ෆාරා, ෆිද්යා

03. සීරා හා ඉස්ලාමීය ඉතිහාසය

3.1 ඉතිහාසය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨි කෝණය
- ඉස්ලාමීය ඉතිහාසයේ සුවිශේෂ ලක්‍ෂණ

3.2 ඉතිහාස අවධි
3.2.1 - නබි (සල්) තුමන්ගේ අවධිය
- නබි (සල්) තුමාට පෙර අවධිය
- නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාල පරිච්ඡේදය
- නබි (සල්) තුමාගේ මදීනා ජීවිත කාල පරිච්ඡේදය

3.2.2 කුලෆාඋර්රාෂිදීන්වරුන්ගේ කාල පරිච්ඡේදය
- කලීෆාවරුන් තෝරා පත් වූ ආකාරය
- රාජ්‍ය විකාශයට තුඩු දුන් හේතූන් සහ විකාශ වූ ආකාරය
- පාලන, මූල්‍ය, අධිකරණ ආයතන
- මුහුණ දුන් අභියෝග
- කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්‍ෂණ හා ආදර්ශ

3.2.3 පසු කාලීන කලීෆාවරුන්ගේ කාල පරිච්ඡේදය
3.2.3.1 උමයියා අවධිය
- උමයියාවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු - පෞරුෂ ලක්ෂණ හා දායකත්වය (මුආවියා, අබ්දුල් මලික්, වලීද්, උමර් ඉබ්හු අබ්දුල් අසීස්)
- රාජ්‍ය විකාශය එහි ප්‍රතිඵල
- මුහුණදුන් ගැටළු

3.2.3.2 අබ්බාසිවරුන්ගේ කාල පරිච්ඡේදය
- අබ්බාසිවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු හා දායකත්වය (මන්සූර්, හාරූන්, මෑමූන්)
- පසු කාලීන කලීෆාවරුන්ගේ පාලනය
- කුලෆාඋර්රාෂිදීන්වරුන්ගේ පාලනය හා සැසඳීම

3.2.3.3 අනෙකුත් රාජ්‍යයන්
- ස්පාඤ්ඤයේ උමයියා පාලනය
- ඉන්දියාවේ මෝගල් පාලනය
- තුර්කියේ උස්මානිය පාලනය

3.2.3.4 වර්තමාන මුස්ලිම් ලෝකය

3.3 ඉස්ලාමීය කලාවන්

3.3.1 විද්‍යාත්මක කලාවන්
- විද්‍යාත්මක කලාවන් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- පහත දැක්වෙන කලාවන්හි වර්ධනය හා නිර්මාණාත්මක දායකත්වය - දර්ශනය, වෛද්‍ය විද්‍යාව, ඉතිහාසය, ගණිතය, භූගෝල විද්‍යාව, තාරකා විද්‍යාව

3.3.2 සෞන්දර්යාත්මක කලාවන්
- සෞන්දර්ය කලා පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටි කෝණය
- පහත දැක්වෙන කලාවන් බිහිවීම සහ වර්ධනය (කිරාඅත් කලාව, කැලිග්‍රාපි අක්ෂර කලාව අරබෙස්ක්, වාස්තු විද්‍යාව, මිනියේචර් කලාව, සංගීත කලාව)

3.4 ඉස්ලාමීය ඉතිහාසයේ මස්ජිද්වල දායකත්වය
- මස්ජිද් බිහිවීම හා එහි කාර්යයන්
- පහත සඳහන් මස්ජිද් බිහිවීම හා ඒවායෙහි වැදගත්කම මස්ජිදුල් හරම්, මස්ජිදුන් නබවි, මස්ජිදුල් අක්සා

3.5 ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය

3.5.1 ආරබිවරුන්ගේ පැමිණීම

3.5.2 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීම

3.5.3 ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්
- ජනගහන විකාශය හා පැරනි සහ නව ජනාවාස
- ජාතික මට්ටමේ දායකත්වය

3.5.4 ආගමික හා සමාජීය ආයතන
- මස්ජිද්
- මුස්ලිම් පුද්ගල නීතිය
- වක්ෆු විවාහය පිළිබඳ නීති රීති
- ක්වාසි අධිකරණය හා අභියාචනා ක්වාසි සභාව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

3.6 මුස්ලිම් ඓතිහාසික පෙර ගමන්කරුවන්

3.6.1 සහාභාවරුන්
(මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) බිලාල් (රලි), සෛද් ඉබ්නු සාබිත් (රලි), දුල්බිජාදෛන් (රලි), උම්මු අමාරා (රලි), අස්මා බින්ති අබුබක්කර් (රලි), ෆාතිමා (රලි)

3.6.2 තාබිඊන්වරුන්, ඉමාම්වරුන්
(උමර් ඉබ්නු, අබ්දුල් අසීස්, සාඊද් ඉබ්නු මූසෙයද්, අතා ඉබ්නු අබී රබාහ්, ඉමාම් සුහ්රි)

3.6.3 චින්තකයින්, ප්‍රතිසංස්කරණවාදීන් (අබ්දුල් කාදිර් ජිලිනි, ඉමාම් ගස්සාලි, අබුල් හසන්, ෂාදුලි, ඉබ්නුල් කෙයුම් අල් ජව්සි, මුහම්මද් ඉබ්නු අබ්දුල් වහ්හාබ්, මෞලානා ඉල්යාස්, ඉමාම් හසනුල් බන්නා, මෞලානා මෞදූදි)

4.0 සමාජ විද්‍යාව හා ආචාර ධර්ම

4.1 සමාජ විද්‍යාව

4.1.1 හැඳින්වීම
- මිනිසා, විශ්වය, ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිකෝණය

4.1.2 පුද්ගලයා
- සමාජයේ පුද්ගලයාගේ දායකත්වය
- සමාජය කෙරෙහි පුද්ගලයාගේ වගකීම

4.1.3 පවුල
- පුද්ගලයා සහ පවුල
මුස්ලිම් සමාජීය ක්‍රමයේ පුද්ගලයාගේ කාර්යභාරය
- පුද්ගලයා ගොඩනැංවීමෙහිලා පවුලේ දායකත්වය හා කාර්ය භාරය
- ඥාති සබඳතා
- ඥාතීන් හා අසල්වැසියන්

4.1.4 සමාජය
- ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ ලක්ෂණ (සමානාත්මතාව, සහෝදරත්වය, නිදහස, යුක්තිය)
- පුද්ගලයා හා සමාජය (අයිතිවාසිකම්)
- යහ ක්‍රියා වර්ධනය කිරීම, අයහපත් ක්‍රියා වැළැක්වීම
- ඉස්ලාමීය පුහුණුකරුවන්ගේ ලක්ෂණ හා කාර්යභාරය
- බහුවාර්ගික සමාජයෙහි මුස්ලිම්වරුන්ගේ සබඳතාව
- දුබලයන්ට ආරක්ෂාව
- රැකියා සඳහා මාර්ගෝපදේශ
- සමාජ ආචාරධර්ම (ඉවසා දරා ගැනීම, නම්‍යශීලි බව, තවාසුන්, නායකත්වයට ගරු කිරීම, සමාජ සන්නිවේදනය)
- සමාජ සබඳතාව තහවුරු කරන හා දුර්වල කරන කරුණු

4.2 ආචාර ධර්ම

4.2.1 - අල්ලාහ් සමඟ සබඳතා
- ඉඛ්ලාස්
- තක්වා (දේව භක්තිය)
- තවක්කුල්
- අල්ලාහ්ගේ තීන්දුව හා කැමැත්ත සතුටින් භාර ගැනීම
- අල්ලාහ් කෙරෙහි දයාව දැක්වීම
- කෙලෙහි ගුණ සැලකීම.

4.2.2 - මිනිස් සබඳතා සමාජ ආචාරධර්ම
- සහෝදරත්වය
- සත්‍යවන්තභාවය
- අවංකභාවය
- සමාවදීමේ ආකල්පය
- පාරිශුද්ධභාවය හා පිරිසිදුකම
- සෙනෙහස
- ලැජ්ජාශීලීබව
- ඉවසීම

4.2.3 අනෙකුත් ජීවීන් හා භෞතික වස්තූන් පිළිබඳ ආචාරධර්ම

- ජීවීන් කෙරෙහි ආදරය දැක්වීම හා ඔවුන්ගේ සුබසිද්ධියට කටයුතු කිරීම
- භෞතික පරිසරය සුරැකීම
- රටේ යහපත සුරැකීම
- ආපදා කළමනාකරණය

**05. ඉස්ලාමීය සාහිත්‍යය අරාබි බස**

5.1 ඉස්ලාමීය සාහිත්‍යය

5.1.1 - ඉස්ලාමීය සාහිත්‍යයේ සංකල්ප හා මූලධර්ම
- නූතන ඉස්ලාමීය සාහිත්‍යය හැඳින්වීමක්

5.2 පහත දක්වා ඇති අය ඉස්ලාමීය සාහිත්‍යට දැක්වූ දායකත්වය
දෙමළ භාෂා මධ්‍යයෙන්
- එම්. සී සිද්ධි ලෙබ්බෙ
- ආචාර්ය එම්. එම්. උවයිස්
- ඒ. එම්. ඒ. අසීස්
- උමර් හස්රත්
- යූ. එම්. තාසිම්
- අබ්දුල් කාදර් ලෙබ්බෙ කවියා

සිංහල භාෂාව තුළින්
- ආචාර්ය එම්. එම්. උවයිස්
- එස්. එම්. මන්සූර්
- ඒ. එම්. ෂාහුල් හමීද්
- එම්. එම්. එම්. ෂම්ස්
- එම්. ඒ. මුහම්මද් මාස්ටර් (දික්වැල්ල)
- මාතර, කාසිම් කවියා

5.3 අරාබි දෙමළ

5.3.1 අරාබි දෙමළ - හැඳින්වීම
- අරාබි දෙමළ ආරම්භය හා වර්ධනය

5.3.2 පහත කෘති පිළිබඳ අවබෝධය
- ෆක්හුද්දයියාන් - ආලිමුල් අරූස්
- තෆ්සීර් - ජ් ෂෙයිකු මුස්තාෆා (බේරුවල)
- ඉබ්නු නූෆාදාගේ කුත්බා
- මීසාන් මාලේ
- කලෙල ෆාතිහා
- තක්කසූරුක්

5.4 අරාබි බස

5.4.1 භාෂා කුසලතා වර්ධනය
- සවන්දීම
- කථනය/කථාබහ
- කියවීම
- ලිවීම

5.4.2 එදිනෙදා ජීවිතයේ භාවිත කළහැකි වදන් හා වාක්‍යාංශ
- කෙටි වාක්‍ය

5.4.3 අරාබිය සිංහලට හෝ දෙමළට හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම හා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසිය අරාබියට පරිවර්තනය කිරීම

5.4.4 දෙන ලද ඡේදයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- දෙන ලද ඡේදයට පිල්ලම් යෙදීම

5.4.5 අල්කුර්ආන්, සුන්නා සාහිත්‍ය රස විඳීම
- මුෆ් රදාතුල් කුර්ආන්
- සිද්ධි වාචනය

5.4.6 අත්කාමුත් දජ්වීද් - තජ්වීද් නීතිරීති

5.4.7 ව්‍යාකරණ පිළිබඳ දැනුම

5.4.7.1 අස්සර්ෆු
- අතීතකාල වර්තමාන කාල ක්‍රියා
- උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ක්‍රියා
- ලිංග භේද, වචන භේද, බහු වචන ප්‍රභේද
- විධි ක්‍රියාව
- අතීත කාල, වර්තමාන කාල, කර්ම කාරක ක්‍රියා
- ක්‍රියා මූල (මස්කර්)
- ඉස්මු ෆාඉල්/ඉස්මු මෆ්උල්
- බහු වචන විවිධත්වය

5.4.7.2 අන්නහ්වු
- අල් මුෆ්තදා, වල් කෆර්
- අල් ෆිඅල් වල් ෆා ඉල්
- අස්මාඋල් ඉෂාරා
- අස්සිෆාත්
- හුරූෆුල් ජර්රු
- අල් මුලාෆ් වල් මුලාෆ් ඉලයිහි
- කාන වඅකවාතුහා
- ඉන්න ව අකවාතුහා
- අල් හාල්

02-370

---

**ආයුර්වේද දෙපාර්තමේන්තුව - ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2007**

උක්ත මැයෙන් 2007.10.05 දින හා එම ගැසට් නිවේදනයේ කරුණු කීපයක් සංශෝධනය කරමින් නැවත වරක් 2007.11.09 දින පළ වූ ගැසට් නිවේදනයන්හි ඇතුළත්,

4. (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරමින් ගැසට් නිවේදනයේ 4(ආ) ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. (ආ) තරග විභාගයේ ලකුණු අනුව පමණක් අයදුම්කරුවන් තෝරා ගනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය ලකුණු ලබාදෙනු නොලැබේ.

අනුමත සත්කාරක කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාවෙන් 80%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් ද, 10%ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද ඉතිරි 10% ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලත් වෛද්‍යවරුන්ගේ දූ දරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ.

තෝරාගත් අයදුම්කරුවන් ආයුර්වේද සිසු හෙද/හෙදියන් වශයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයට යොමුකරනු ලබන අතර, ඔවුන් සිංහල/දෙමළ මාධ්‍යයෙන් අවුරුදු 03ක පුහුණු වීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

02-518

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ 11 පන්තියේ (ආ) බණ්ඩයේ ස්ථිර මාර්ග පරීක්ෂක, ගොඩනැගිලි පරීක්ෂක, පාලම් පරීක්ෂක, සංඥා හා විදුලිසංදේශ පරීක්ෂක, ධාවනාගාර ෆෝමන්, යාන්ත්‍රික ෆෝමන් යන තනතුරු වලට බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීම**

මෙම දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති එක් එක් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා 2008.03.15 දිනට වයස අවුරුදු 21ට වැඩි සහ 30ට නොවැඩි (රජයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ) ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2008.03.15 වේ. සියළුම අයදුම්පත් එදිනට ප්‍රථම දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලැබෙන සේ දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. අංක 355, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම නොකළ යුතුය. අසම්පූර්ණ අවිධිමත් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පලාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතුය.

(01) අයදුම්පත් කැඳවනු ලබන තනතුරු :

ස්ථිර මාර්ග පරීක්ෂක
ගොඩනැගිලි පරීක්ෂක
පාලම් පරීක්ෂක
සංඥා හා විදුලි සංදේශ පරීක්ෂක
ධාවනාගාර පෝමන්
යාන්ත්‍රික පෝමන්

(02) එක් එක් තනතුරුවල රාජකාරී සහ එහි ස්වභාවය :

1. *ස්ථිර මාර්ග පරීක්ෂක :*
දුම්රියේ ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය මාර්ග පද්ධතිය අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, හා පවත්වාගෙන යාමේ දී, වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

2. *ගොඩනැගිලි පරීක්ෂක :*
ගොඩනැගිලි අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම හා පවත්වාගෙන යාමේ දී වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

3. *පාලම් පරීක්ෂක :*
දුම්රිය මාර්ග පද්ධතියේ සියළුම වර්ගයේ පාලම් අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, හා පවත්වාගෙන යාමේදී වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

4. *සංඥා හා විදුලි සංදේශ පරීක්ෂක :*

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් සංඥා පද්ධතිය හා විදුලි සංදේශ ක්‍රමයක් අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, හා පවත්වාගෙන යාමේ දී වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

5. *ධාවනාගාර ෆෝමන් :*
දුම්රිය එන්ජින් රිය පෙට්ටි හා මැදිරිවල සිදුවන කාර්මික දෝෂ හඳුනාගෙන ඒවා අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, හා පවත්වාගෙන යාමේ දී වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

6. *යාන්ත්‍රික පෝමන් :*
දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් එන්ජින්, ගැල් මැදිරි ඇතුළු යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම, අදාළ පරිදි අවශ්‍ය අමතර කොටස් අළුතින් නිෂ්පාදනය කිරීම නඩත්තු කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී වැඩ අධීක්ෂකයකුගේ කාර්යභාරය ඉටු කිරීම.

(03) වැටුප් පරිමාණය (රා.ප.ච. 06/2006 අනුව)
11 (ආ) : එම්එන් — 3-2006-111

(04) අධ්‍යාපන සුදුසුකම් :

දුම්රිය අධීක්ෂණ කලමනාකරණ සේවයේ 11(ආ) බණ්ඩයට ඇතුළත් කර ගැනීම සඳහා භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම;

සහ

පැරණි විෂය නිර්දේශය අනුව ශුද්ධ ගණිතය,ව්‍යවහාර ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විද්‍යා විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් 03කින්;

හෝ

නව විෂය නිර්දේශය අනුව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විද්‍යා විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයන් 03කින් අ.පො.ස. උසස් පෙළ විභාගය එකවර සමත්විය යුතුය.

සහ

ඉහත සඳහන් මූලික සුදුසුකම් සහිතව පහත සඳහන් ආයතනයකින් පිරිනමනු ලබන සේවයට අදාළ ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. (ස්ථිර මාර්ග පරීක්ෂක, ගොඩනැගිලි පරීක්ෂක හා පාලම් පරීක්ෂක යන තනතුරු වලට අයදුම් කරන්නන් සිවිල් ඩිප්ලෝමාධාරීන් ද, යාන්ත්‍රික පෝමන් හා ධාවනාගාර පෝමන් යන තනතුරු සඳහා අයදුම්කරන්නන් යාන්ත්‍රික හෝ විදුලි ඩිප්ලෝමාධාරීන් ද, හා සංඥා හා විදුලි සංදේශ පරීක්ෂක තනතුරු සඳහා අයදුම්කරන්නන් විදුලි හෝ ඉලෙක්ට්‍රොනික ඩිප්ලෝමාධාරීන් ද විය යුතුය.)

(1) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව.
(2) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව.
(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.
(4) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.

(05) බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත (04)හි දක්වා ඇති සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරඟ විභාගයක් පවත්වා ලබාගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

(06) බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය :

(1) මෙම විභාගය තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය මත විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(11) විභාග ක්‍රමය :
(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
(ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි.

(111) විභාගයේ විෂයන් :
(අ) බුද්ධි පරීක්ෂණය
(ආ) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

විෂය නිර්දේශය :
(අ) බුද්ධි පරීක්ෂණය
කාලය පැය — 01 යි. මුළු ලකුණු 100යි.

අපේක්ෂකයකු සතු අවබෝධකර ගැනීමේ ශක්තිය, තර්කානුකූල විචාර බුද්ධිය, විඥාන ශක්තිය ද ක්ෂණිකව නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ද, තක්සේරු කිරීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටලු, භාෂා ඛණ්ඩ, වගු පින්තූර හා ප්‍රස්ථාර ද, උපයෝගී කර ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(ආ) තාක්ෂණ විෂය :
කාලය පැය 03 යි - මුළු ලකුණු 100 යි.

බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඩිප්ලෝමා සහතිකය හෝ සමාන සහතික ලාභියෙකු සතුව පැවතිය යුතු තාක්ෂණික දැනුම මට්ටම හා ඉදිකිරීමේදී හා නඩත්තු ක්ෂේත්‍රයේදී භාවිතා කරනු ලබන නවීන යන්ත්‍ර සූත්‍රවල ක්‍රියාකාරිත්වය පිළිබඳව ඇති දැනුම පරීක්ෂා කෙරෙන ආකාරයේ ප්‍රශ්න ඇතුලත් කෙරෙනු ඇත. මෙම ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය එක් එක් තනතුර සඳහා වෙනස් බැවින් තමන් අපේක්ෂා කරන තනතුරට අදාළ විෂය නිර්දේශය යටතේ විභාගයට පෙනී සිටීමට ඒ ඒ අපේක්ෂකයන්ට සිදුවේ. එක් එක් විෂය නිර්දේශය පහත දක්වා ඇත.

*ස්ථිර මාර්ගය පරීක්ෂක අයදුම්කරුවන් සඳහා* :

දුම්රිය මාර්ග ඉදිකිරීමේ ක්‍රම, දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා නවීන යන්ත්‍ර භාවිතය, දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා පිඹුරුපත් සැකසීම හා කියවා වටහා ගැනීමේ හැකියාව යන කරුණු හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මෙයට ඇතුළත් වේ.

*පාලම් පරීක්ෂක අයදුම්කරුවන් සඳහා* :

දුම්රිය පාලම් ඉදිකිරීමේ ක්‍රම, දුම්රිය පාලම් ඉදිකිරීම සඳහා නවීන යන්ත්‍ර භාවිතය, දුම්රිය පාලම් ඉදිකිරීම සඳහා පිඹුරුපත් සැකසීම හා කියවා වටහා ගැනීමේ හැකියාව යන කරුණු හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය හා සහජ හැකියාව මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මෙයට ඇතුළත් වේ.

*ගොඩනැගිලි පරීක්ෂක අයදුම්කරුවන් සඳහා* :

ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු පිළිබඳව ඇති දැනුම, ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය, ගොඩනැගිලි ඉදිකිරීමට හා අලුත්වැඩියාවට අදාළ ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, යන කරුණු හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය හා සහජ හැකියාව මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මීට ඇතුළත් වේ.

*සංඥා හා විදුලි සංදේශ පරීක්ෂක අයදුම්කරුවන් සඳහා* :

යාන්ත්‍රික සංඥා ක්‍රම, විදුලි සංඥා ක්‍රම හා සම්බන්ධිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මීට ඇතුළත් වේ.

*යාන්ත්‍රික ෆෝමන් අයදුම්කරුවන් සඳහා* :

දුම්රිය එන්ජින්, ගැල් මැදිරි, රිය පෙට්ටි, සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ, වල දෝෂ හඳුනා ගැනීම එම හඳුනාගත් දෝෂ නිර්දෝෂ කර ක්‍රියාකරවීම හා යථාවත් කිරීම යන කරුණු හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මීට ඇතුළත් වේ.

*ධාවනාගාර ෆෝමන් අයදුම්කරුවන් සඳහා* :

දුම්රිය එන්ජින් හා බලවේග කට්ටලවල ක්‍රියාකාරිත්වය, හා දෝෂ හඳුනා ගැනීම, එම දෝෂ ධාවනයට සුදුසු අන්දමින් යථාවත් කිරීමේ හැකියාව, යන කරුණු සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව ඇති අවබෝධය මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න මීට ඇතුළත් වේ.

*තේරීම් පරිපාටිය* :

එක් විෂයකින් සුදුසුකම් ලැබීම සඳහා ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය. මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත් වන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීමක් සිදු කරනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත් විෂයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්ව ඇත්තාවූත් අපේක්ෂකයන් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව 11 පෙළ (ආ) ඛණ්ඩයේ තනතුරුවලට පත් කරනු ලැබේ.

(07) *අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස්* :

(I) අයදුම්පත A-4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතුය.

අයදුම්පතේ,

1 පිටුවේ එහි (අ) කොටසේ (1) සිට (9) දක්වා ඇති කරුණු ද,

2 පිටුවේ එහි (ආ) කොටසේ (1) සිට (3) (111) දක්වා ඇති කරුණු ද,

3 පිටුවේ එහි (ආ) කොටසේ (3) IV සිට (ඇ) කොටසේ (01) (ඈ) දක්වා ඇති කරුණු ද,

4 පිටුවේ අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඇතුළත් විය යුතුය.

(II) එක් අපේක්ෂකයකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණකි. එම තෝරා ගැනීම සඳහා මෙම නිවේදනයේ (01), (02), (03), (04) හා (06) හොඳින් කියවා වටහා ගැනීම පහසුවක් වනු ඇත.

(III) කුමන හේතුවක් නිසා වුවත් ඉහත දක්වා ඇති අපේක්ෂා කරන තනතුර වෙනස් කිරීමට පසු අවස්ථාවක ඉඩ දෙනු නොලැබේ.

(IV) අදාළ විභාගයේ විභාග ගාස්තුව රු. 250කි. එය ඔබට පහසුම තැපැල් කාර්යාලයකට ගෙවිය යැකිය. අයදුම්පත සමග එසේ ගෙවා ලබාගන්නා මුදල් ඇනවුමේ මුල්පිටපත නොගැලවෙන සේ අදාළ තැන ඇලවිය යුතුය. මෙම මුදල් ඇනවුමේ ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. මුදල් ඇනවුම දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නමට මරදාන තැපැල් කාර්යාලයෙන් මාරු කිරීමට හැකිවන සේ ලබාගත යුතුය.

(V) අයදුම්පත සමග කිසිදු සහතිකයක් හෝ ලිපියක මුල් පිටපත් හෝ ඡායා පිටපත් හෝ නොඑවිය යුතුය. එසේ එවන මුල් පිටපත් හෝ ඡායා පිටපත් පිළිබඳව කිසිදු වගකීමකට දෙපාර්තමේන්තුව බැඳෙන්නේ නැත.

(VI) බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු රා.ප.ච. 06/0026 අනුව රු. 19,755 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් දරන රජයේ නිලධාරියෙකු විසින් සිදුකළ යුතුය.

(VII) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

08. සේවා කොන්දේසි

(I) දෙවන පන්තියේ (ආ) ඛණ්ඩයේ තනතුරුවලට බඳවා ගනු ලැබුවද වසර 03ක පුහුණු කාලයකට යටත්වේ. මෙම පුහුණු කාලය තුළ හා පුහුණු කාලය අවසානයේදී වරින්වර පැවැත්වෙන පුහුණුවට සම්බන්ධ වූ පරීක්ෂණවලින් සමත්විය යුතුය. පුහුණුව අවසානයේදී පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත්වනු ලබන අය සේවයේ ස්ථිර කරනු ලබන අතර එම පරීක්ෂණයෙන් අසමත් වුවහොත් පිටතින් බඳවාගත් අයගේ සේවය අවසන් කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කලින් තනතුරට ආපසු යවනු ලැබේ.

(II) II (ආ) ඛණ්ඩයේ නිලධාරියෙකු වශයෙන් තෝරාගනු ලබන්නන් පුහුණු පරීක්ෂණයෙන් සමත්වීමෙන් පසුව අවුරුදු 10ක කාලයක් මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, එසේ කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කිරීම සඳහා වියදම් වූ සහ එම කාලය තුළ ලබාගත් දීමනා සහ වැටුප් ආපසු ගෙවන බවටත්, පුහුණුව ආරම්භ කර තෙමසක් තුළ බැඳුම්කරයට අත්සන් කළ යුතුය. එසේ නොකළ හොත් තෝරා ගැනීම අවලංගු කරනු ලැබේ.

සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි ඃ

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(II) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, විටින්විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

ටී. ලලිතසිරි ගුණරුවන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

කොළඹ 10.
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ය.

(මේ අනුව ඒ 4 කඩදාසිවල පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගැනීම මැනවි)

අයදුම්පත් ආදර්ශ

කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි

[ ]

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ ………… තනතුර සඳහා අයදුම්පත්‍රය

(අ) කොටස (අයදුම්පතේ 1 වැනි පිටුවේ)

(01) අයදුම්කරන තනතුර :————.

(02) මුලකුරු සමග අගට යෙදෙන නම :————.

(I) සිංහලෙන්/දෙමළෙන් :————.

(II) ඉංග්‍රීසියෙන් :————.

(03) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

(I) සිංහලෙන්/දෙමළෙන් :————.

(II) ඉංග්‍රීසියෙන්:————.

(04) ස්ථිර ලිපිනය :————.

(I) සිංහලෙන්/දෙමළෙන් :————.

(II) ඉංග්‍රීසියෙන් :————.

(05) ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුවේ "✓" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ]  පුරුෂ : [ ]

(06) පදිංචිය:————.

(I) ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා අංකය :————.

(II) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.

(III) දිස්ත්‍රික්කය :————.

(07) ජන වර්ගය (අදාල කොටුවේ "✓" ලකුණ යොදන්න)

| | | | |
|---|---|---|---|
| සිංහල | [ ] | ඉන්දියා ද්‍රවිඩ | [ ] |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | [ ] | බර්ගර් | [ ] |
| මුස්ලිම් | [ ] | මැලේ | [ ] |
| වෙනත් | [ ] | | |

(08) විභාගය සඳහා ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ "✓" ලකුණ යොදන්න)

සිංහල [ ]  දෙමළ [ ]  ඉංග්‍රීසි [ ]

(09) පුරවැසිභාවය (අදාළ කොටුවේ "✓" ලකුණ යොදන්න)

පරම්පරාවෙන් [ ]  ලියාපදිංචිවීමෙන් [ ]

(අයදුම්පතේ 2 වැනි පිටුවේ)

(ආ) කොටස

(01) (I) උපන් දිනය :—————.

(I) 2008.03.15 දිනට වයස අවු.:————. මාස:————.දින:————.

(02) ජාතික හැඳුනුම්පත් අංකය :—————.

(03) අධ්‍යාපන සුදුසුකම් :—————.

(I) අ.පො.ස. (සා.පෙළ) - පළමුවර

විභාග අංකය : වර්ෂය :

| අනු අංකය | විෂය | ශ්‍රේණිය | අනු අංකය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| (i) | | | (v) | | |
| (ii) | | | (vi) | | |
| (iii) | | | (vii) | | |
| (iv) | | | (viii) | | |

(II) අ.පො.ස. (සා.පෙළ) - දෙවන වර

විභාග අංකය : වර්ෂය :

| අනු අංකය | විෂය | ශ්‍රේණිය | අනු අංකය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| (i) | | | (v) | | |
| (ii) | | | (vi) | | |
| (iii) | | | (vii) | | |
| (iv) | | | (viii) | | |

(iii) අ.පො.ස. (උ.පෙළ)

විභාග අංකය : වර්ෂය :

| අනු අංකය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

(අයදුම්පතේ 3 වැනි පිටුවේ)

(IV) තාක්ෂණික සුදුසුකම් :

පාඨමාලාවේ/සහතිකයේ නම :—————.
ආයතනය :—————.
ලබාගත් වර්ෂය :—————.
ලද සාමාර්ථයන් :—————.

(04) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

(ඇ) කොටස

(01) අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස හා/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගුවන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බවද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවාද මම පුද්ගලිකවම දරා ගනිමි.

(ඇ) ......... තැපැල් කාර්යාලයට රු. 250ක් ගෙවා ලබාගත් අංක ......... දරන මුදල් ඇනවුම මේ සමග අමුණා ඇත)

| මුදල් ඇනවුම මෙහි අමුනන්න |
|---|

(ඈ) මම මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

—————.
අයදුම්කරුගේ අත්සන.

(අයදුම්පතේ 4 වැනි පිටුවේ)

(02) අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ මහතා/ මහත්මිය/මෙනවිය මම හොඳින් හඳුනමි. ඔහු/ඇය ............... දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද සහතික කරමි.

—————.
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය:—————.

(කරුණාකර නිලමුද්‍රාව තබන්න)

(03) දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

(දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතුවූවන්ට පමණකි)

ඉහත අයදුම්පත ඉදිරිපත් කර ඇති ..................... මහතා/ මහත්මිය/මෙනවිය .................. දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ......... දින සිට ......... දින දක්වා ..................... වශයෙන් සේවය කර ඇත. ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තාවී නැත/ඇත. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකය/අසතුටුදායකය. ඔහු/ඇය දුම්රිය දෙපාර්තමේන්තුවේ ................. තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි /නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

—————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
නම :—————.
තනතුරු නාමය :—————.
ලිපිනය :—————.

(කරුණාකර නිලමුද්‍රාව තබන්න)

02-388

## ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2008 මාර්තු

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත්විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2008 මාර්තු මස 30 වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. සුදුසුකම් :

මෙම විභාගයට අයදුම්කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. අයදුම්පත් :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, “සුවසිරිපාය” ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2008.02.29 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30.0 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පතක් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

I විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කර ගැනීම :

I පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය
(ඇ) රියදුරු බලපත්‍රය
(ඈ) ගමන් බලපත්‍රය

06. විභාග පරිපාටිය :

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතුය එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ අදාළ සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

07. විභාග නිර්දේශ මාලාව :

07:1 ලිඛිත විභාගය
07:1:1 ආයතන සංග්‍රහය
කාලය පැය 02 යි. ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි.

විෂය නිර්දේශය :

i. ආයතන සංග්‍රහය
(අ) I කොටස - II, III,V,VI,VIII,IX,XI,XII,XIII,XV, XXIV, XXV,XXVII,XXVIII,XXX,XXXI,XXXII,XXXIII පරිච්ඡේද
(ආ) II කොටස - XLVII සහ XLVIII වැනි පරිච්ඡේද

ii. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය

7:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්ණ 04කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය :

සෞඛ්‍ය සේවා සංග්‍රහය :

I වැනි කොටස - වෛද්‍ය සේවා
II වැනි කොටස - රසායනාගාර සේවා

7:1:3 ගිණුම් :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්ණ 04කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය :

i. මුදල් රෙගුලාසි - I වැනි කොටස

| | | | |
|---|---|---|---|
| පරිච්ඡේද | I | - | සියළුම වගන්ති |
| | II | - | සියළුම වගන්ති |
| | III | - | සියළුම වගන්ති |
| | IV | - | සියළුම වගන්ති |
| | V | - | 1,2,3,4 සහ 6 වගන්ති |
| | VI | - | සියළුම වගන්ති |
| | VII | - | 1,2,3,4 සහ 6 වගන්ති |

ii. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි.

iii. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්.

iv. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි.

7:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100කි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

09. 2007 සැප්තැම්බර් විභාගයට අදාළ ප්‍රතිඵල ඉක්මනින් නිකුත් කරන බව කරුණාවෙන් සලකන්න.

වෛද්‍ය යූ. ඒ. අජිත් මෙන්ඩිස්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය ලේකම් වෙනුවට.

2008 ජනවාරි මස 30 වැනි දින
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
“සුවසිරිපාය”,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2008 මාර්තු**

01. (අ) i. අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන්, මුලකුරු අගට යොදා ලියන්න) :————.

ii. අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න) :-

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

iii. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

iv. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) i. නිල නාමය (වෛද්‍ය නිලධාරි/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි) :————.

ii. සීමාවාසික පත්වීම ලද දිනය :————.

iii. ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓)ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න. :————.

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | | රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | | ගිණුම් | |
| සිංහල වාචික | | දෙමළ වාචික | | | |

03. (අ) දැන් සේවය කරන ආයතනය :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය (මෙම මධ්‍යස්ථානයට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම අයදුම්කරුවන් කොළඹ විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.) අදළ කොටුවේ හරි ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | මුල්ලේරියාව | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | |
| කුරුණෑගල | | අනුරාධපුරය | | රත්නපුරය | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | |

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද ? :————.

(ඉ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද?:————.

(ආ) ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද ? :————.

මුද්දර කොටුව

06. අයදුම්කරුගේ සහතිකය :

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ......... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්*, මෙම ඉල්ලුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ

විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

—————.
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..................මහතා/මිය/මෙනවිය* මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු වන අතර, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන බවට ද රු. ......... ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා* ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

—————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

**විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය**

............ මහතා/මිය./මෙනවිය* වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ* සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

—————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය).

දිනය :—————.

(*අනවශ්‍ය කොටස් කපා හරින්න)

02-390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.